**කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 22 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොබෙයිගනේ ළමා උද්‍යානයේ රු.2,559,755 ක් වූ ඉදිකිරීම්වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සභාව විසින් දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබාදී තිබුණු කඩ කාමරයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**----------------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 07 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛනවල ශේෂයන් අතර, රු.407,755 ක නොසැසඳීම් පැවතුණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**
**----------------------------------**

(අ) ලැබියයුතු ගිණුම්
--------------------

2017 දෙසැම්බර් 31 දිනට රු.34,995,252 ක් වූ ලැබියයුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.21,094,287 ක් වූ ගෙවියයුතු ශේෂවලින් රු.3,224,994 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් නොකළ ශේෂ විය.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතු වටිනාකම රු.3,881,071 ක් වූ ලැබිය යුතු හා සවිකිරීම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| (i) 3.4.3 (ඇ) මාර්ගෝපදේශය | 219,900 | වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ මිල කැඳවීමේදී ලියාපදිංචි නොවූ සැපයුම් ආයතනවලින්ද මිල ගණන් කැඳවා තිබුණි. |
| (ii) 6.2.2 මාර්ගෝපදේශය | - | වාහන 03 ක් සහ යන්ත්‍ර 01 ක් අළුත්වැඩියා කිරීම සඳහා ලංසු කැඳවීමේදී ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ අවම කාල සීමාව අනුව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,270,532 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,920,871 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 805 | 1,110 | 1,063 | 263 | 1,214 | 898 | 506 | 215 |
| (ii) බදු කුලී | 3,245 | 3,572 | 3,577 | 8 | 1,251 | 1,376 | 1,393 | 14 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,026 | 1,046 | 1,046 | - | 670 | 1,174 | 1,174 | - |
| (iv) වෙනත් ආදායම් | 42,530 | 50,419 | 44,625 | 25,888 | 41,039 | 44,840 | 46,985 | 12,295 |
| එකතුව | 47,606 | 56,147 | 50,311 | 26,159 | 44,174 | 48,288 | 50,058 | 12,524 |

සටහන

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රුපියල් මිලියන 12 ක හිඟ ආදායමින් රැස්කළ රුපියල් මිලියන 10 ක් සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම තුළ ඇතුළත්ව තිබුණි.

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-----------------------------------**

සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රුපියල් මිලියන 56 ක් වූ අතර, ඉකුත් වර්ෂවල හිඟ ආදායම්වලින් රුපියල් මිලියන 10 ක් සමග එකතුව රුපියල් මිලියන 50 ක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 12 ක් වූ හිඟය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රුපියල් මිලියන 26 ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

**-------------------**

රු.215,312 ක් වූ ආරම්භක හිඟයෙන් සමාලෝචිත වර්ෂයේ රු.51,739 ක් අයකර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් හා අක්කර බදු හිඟය රු.262,801 ක් විය.

**2.2.4 බලපත්‍ර ගාස්තු**

**---------------**

2017 වර්ෂයේ වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම් සඳහා වෙළඳ ආයතන 535 ක් සමීක්ෂණය කර අයදුම්පත් නිකුත් කර තිබුණද, එයින් 300 ක් පමණක් මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත යොමුකර තිබුණි. එයින් 77 ක් පමණක් බලපත්‍ර සඳහා නිර්දේශ ඉදිරිපත් කර තිබුණු අතර, සභා බල ප්‍රදේශයේ වෙළඳසැල් 458 ක් වෙළඳ බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු සිදුකරන බව නිරීක්ෂණය විය.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ රු.4,983,802 ක් හා මුද්දර ගාස්තු රු.8,429,800 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කාර්යසාධනය**

**----------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිට කාරණා 07 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාවට අයත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සඳහා 2017 වර්ෂයේදී රු.718,465 ක් වැයකර තිබූ නමුත් මධ්‍යස්ථාන භූමියේ දිරන කසළ ගොඩ ගැසී තිබුණු අතර, සේවක හිඟය හේතුවෙන් ඉල්ලුමට සරිලන පරිදි කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමට සභාවට නොහැකි වී තිබුණි.

(ii) නොදිරන කසළ ගොණු කිරීම සඳහා බේල් යන්ත්‍රයක් නොතිබීම නිසා කම්කරුවන් විසින් අතින් තද කරමින් මෙම කාර්ය ඉටුකර තිබුණද, එය කාර්යක්ෂම මට්ටමක නොතිබුණි. තවද නොදිරන කසල යම් ප්‍රමාණයක් දෛනිකව මධ්‍යස්ථාන භූමියේ වැළලීමද සිදු කරමින් පැවතුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය අනුව දිළිඳුකම තුරන් කිරීම සඳහා ගෙවතු වගා වැඩසටහන්, සෞඛ්‍ය හා ශරීර සුවතාවය වර්ධනය සඳහා මාතෘ හා ළමා ආරක්ෂණ සේවා වැඩසටහන්, රෝග මර්ධන වැඩසටහන්, විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන්, ක්‍රීඩා කටයුතු හා තරුණ සංවර්ධන කටයුතු හා ආයුර්වේද සායන, යටිතල පහසුකම් වර්ධන සඳහා ඉදි කිරීම්, මාර්ග අළුත්වැඩියා හා නඩත්තු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**--------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සතු යන්ත්‍ර සූත්‍ර, කාර්යාල උපකරණ ඇතුළු වත්කම් සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛනයක්, කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳ තොග ලේඛනයක් හා හොල්සිම් ආයතනය වෙත ද්‍රව්‍ය යැවීමේ ලේඛනයක් මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන නොතිබුණි.

(ආ) සභාව සතු කැබ් රථයක් 2014 මාර්තු 27 දින රු.1,276,600 ක් වැයකර එන්ජිම අළුත්වැඩියා කර කිලෝ මීටර් 50,000 ක් පමණ ධාවනය කර තිබියදී 2015 අගෝස්තු 10 දින එන්ජිම ක්‍රියාවිරහිත වී තිබුණි. 2018 මාර්තු 09 දින වන විටත් වාහනය අළුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) සභාව විසින් බාහිර ආයතනවලින් කුලී පදනම මත ලබාගෙන තිබුණු යන්ත්‍ර සහ වාහනවල ක්‍රියාකාරී පැය ගණන් පිළිබඳ විස්තර පවත්වා නොතිබීම හේතුවෙන් එම ආයතනවලින් ඉල්ලා තිබූ රු.2,287,606 ක මුදල ගෙවීමට නොහැකි වී තිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ එකක් රු.126,000 බැගින් ජංගම වෙළඳ කුටි 05 ක් සභාව වෙත ලැබී තිබුණු අතර, ව්‍යාපෘති වාර්තාව අනුව 2017 දෙසැම්බර් මාසය තුළම වෙළඳ කුටි සුදුසු ස්ථානවල ස්ථාපිත කර ව්‍යාපාරික කටයුතු ආරම්භ කරන බව දක්වා තිබුණද, 2018 මාර්තු වනවිටත් ප්‍රතිලාභීන් තෝරාගෙන අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 3.4 ආර්ථික නොවූ ගණුදෙනු

-------------------------

තරඟකාරී රාජ්‍ය මූල්‍ය ආයතනවලින් පොලී පිළිබඳව විමසීම් නොකර මාසිකව පොලී ලබා ගනිමින් වාර්ෂිකව සියයට 7.2 ක පොලී අනුපාතයක් මත රාජ්‍ය වාණිජ බැංකුවක රු.2,500,000 ක් ස්ථාවර තැන්පත් වශයෙන් ආයෝජනය කර තිබුණි.

## 3.5 ප්‍රසම්පාදනය

---------------

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.5.2 සැපයීම් හා සේවා

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පෙරටු කාර්යාලය සඳහා උපකරණ මිලදී ගැනීමේදී මිල ගණන් කැඳවීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව රු.161,000 ක් වූ ටයර් 04 ක් මිලදීගෙන තිබුණි.

(ඇ) සැපයුම්/සේවා සඳහා මිල ගණන් කැඳවීමේ සිට සැපයුම්කරුවෙකු තෝරා ගන්නා අවස්ථාව තෙක් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ බොහෝ අඩුපාඩු පැවතුණි.

(ඈ) පරිගණක 03 ක් මිලදී ගැනීම සඳහා පමණක් කළමනාකරණ කමිටු අනුමැතිය ලබාදී තිබුණද සභාව විසින් රු.638,330 ක් ගෙවා පරිගණක 08 ක්, යූපීඑස් 08 ක් හා වයිරස් ගාඩ් 05 ක් මිලදීගෙන තිබුණි.

### 3.5.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අරළුවැව පෙර පාසල සඳහා වැසිකිලි පද්ධතියක් ඉදි කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයයන් 18 කට අදාළව රු.114,595 ක් ගිවිසුම්ගත ප්‍රමාණය ඉක්මවා ගෙවීම් සිදුකර තිබුණි.

(ආ) ඉහළ ලෝලංවැව හරහා පානව මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයයක් යටතේ රු.344,378 ක් ගෙවා තිබුණද, කොන්ක්‍රීට් ස්ථරය සම්පූර්ණයෙන්ම ගැලවෙමින් ගල් හා වැලි මතුවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) බොරළුවැව පුස්තකාලය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ බිත්තිවල තීන්ත ආලේපනය නියමිත පරිදි සිදුකර නොතිබියදී රු.184,525 ක් වූ සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.

(ඈ) 2017 වර්ෂයේදී රු.1,156,092 ක් වැයකර ඉදිකර තිබුණු ළිදෙන් ජල සැපයුම ලබාදීමට අදාළ නල එලීම සහ ජල පොම්පයක් සවිකිරීම 2018 මාර්තු 16 දින වන විටද ඉටුකර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

වැය විෂයයන් 14 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 38 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නිලධාරීන් 03 දෙනෙකු යොදවා තිබුණද, එම නිලධාරීන්ට විගණන රාජකාරියට අමතරව වෙනත් රාජකාරීන්ද පවරා තිබුණි. සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම |
| | (ii) ගිණුම්වල සටහන් කිරීමේ දෝෂ පැවතීම |
| (ආ) වත්කම්/දේපල | (i) ආරක්ෂාව තහවුරු නොකිරීම |
| | (ii) නිසි පරිදි නඩත්තු නොකිරීම |

| | | |
|---|---|---|
| (ඇ) | ආදායම් පාලනය | හිඟ ආදායම් අයකර ගැනීමේ දුර්වලතා පැවතීම |
| (ඈ) | ව්‍යාපෘති/කොන්ත්‍රාත් | (i) ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම<br>(ii) ඇස්තමේන්තු සකස් කිරීමේ අඩුපාඩු පැවතීම |